# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

## Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය - 2017** | **11 ශ්‍රේණිය**

**Second Term Test - 2017** | **Grade 11**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය -I | **පැය එකයි**

**Information Communication Technology – I** | **One hour**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න

01. දෙවන පරම්පරාවේ පරිගණක සඳහා භාවිතා කරන ලද මූලික සැකසුම් උපක්‍රමය වනුයේ,
    (1) අනුකලිත පරිපථ (IC) (2) ට්‍රාන්සිස්ටර් (Transistors)
    (3) රික්තක නල (Vaccum tubes) (4) ක්ෂුද්‍ර සකසන (Micro Processors)

02. තොරතුරු තාක්ෂණය නිසා බිලියන ගණනින් වූ ජනතාවගේ කටයුතු පහසු වී ඇත . මෙම ප්‍රකාශය,
    (1) ගුණාත්මක දත්තයක් සහිත වාක්‍යයකි. (2) අදාළ බව සහිත වාක්‍යයකි.
    (3) ප්‍රමාණාත්මක දත්ත සහිත වාක්‍යයකි. (4) ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙඅංශයම නියෝජනය වන වාක්‍යයකි.

03. මිශ්‍ර පරිගණකයකට උදාහරණයකි,
    (1) සංවේදක සහිත මාර්ග ලාම්පු (2) ටැබ්ලට් පරිගණකය (3) ECG යන්ත්‍රය (4) කාලගුණ මිනුම් යන්ත්‍ර

04. අමල් හා කමල් අත තිබූ මුදල් පිළිවෙළින් ඒකක 18 හා 20 ක් වේ . එය පිළිවෙළින් දැක්වෙන්නේ,
    (1) $10010_2$ සහ $25_8$ (2) $10010_2$ සහ $24_8$ (3) $31_8$ සහ $10111_2$ (4) $31_8$ සහ $25_8$

05. $0.11010_2$ හි වැඩිම වෙසෙසි අගය සහ අඩුම වෙසෙසි අගය පිළිවෙළින් දැක්වෙනුයේ,
    (1) 0 සහ 0 (2) 1 සහ 1 (3) 1 සහ 0 (4) 0 සහ 1

06. පහත කවර වගන්තිය / වගන්ති සත්‍ය වේද ?
    A. - දෘඩ තැටියෙහි , ප්‍රධාන මතකයට වඩා වැඩි ධාරිතාවයක් ඇත .
    B. - විදුලිය විසන්ධි කළ විට ප්‍රධාන මතකයේ අඩංගු දත්ත නැති වන නමුත් දෘඩ තැටියෙහි රැඳුණු දත්ත නැති නොවේ.
    C. - ප්‍රධාන මතකයේ අඩංගු දත්ත ආචයනය සඳහා ඉලෙක්ට්‍රොනික පරිපථ භාවිතා වන අතර දෘඩ තැටියෙහි ඇති දත්ත ආචයනය සඳහා චුම්බක මාධ්‍ය භාවිත වේ
    (1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A, B සහ C යන සියල්ලම

07. BCD ක්‍රමයට අනුව 250 දැක්වෙන නිවැරදි බිටු රටාව වනුයේ ,
    (1) 001100000001 (2) 001001010000 (3) 001100000000 (4) 111000100000

08. A සහ B ආදාන ලෙස ඇති පහත තාර්කික ද්වාරයේ ප්‍රතිදාන වනුයේ,




    (1) $\overline{A+B}$ (2) A.B (3) A+B (4) $\overline{A}$+B

09. Z =( $\overline{A.B}$) + C යන බූලීය ප්‍රකාශනය සඳහා සුදුසු තාර්කික ද්වාරය තෝරන්න .

(1)



(3)



(2)



(4)


10. පහත ප්‍රකාශන වලින් නිවැරදි වන්නේ,

(1) ජාලයේ ඇති පරිගණකයක් අනන්‍යව හඳුනා ගැනීමට IP ලිපිනය භාවිත කරයි.

(2) වෙබ් අඩවියක් දැක ගැනීමට වෙබ් බ්‍රවුසරයට IP ලිපිනය සමග URL ද ඇතුලත් කරයි.

(3) වසම් නාමය (domain name ) යනු IP ලිපිනය (address) වේ.

(4) ඉහත කිසිවක් නොවේ.

11. පද සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් ලිපියක සීමා (Margin) සකස් කළ හැක්කේ ,

(1) පිටු සූදානම් කිරීම .(Page setup) (2) Borders and Shadings

(3) පාඨ දාරය (text border) (4) මුද්‍රිත පෙර දසුන (Print Preview)

12. වදන් සැකසුම් මෘදුකාංගයක ඇති  සහ  අයිකන භාවිතයෙන්,

(1) අනුඡේදනය සහ උඩු ලකුණ යෙදිය හැක. (2) යටි ලකුණ සහ එකෙල්ල කරගත හැක.

(3) යටි ලකුණ සහ පේලි පරතරය සැකසිය හැක. (4) අනුඡේදනය සහ පේලි පරතරය සැකසිය හැක.

13. විද්‍යුත් සමර්පණයක දෘශ්‍ය රාමුවක පසුතලය (Background) වෙනස් කිරීම සම්බන්දයෙන් අසත්‍ය ප්‍රකාශය වනුයේ ,

(1) පසුතලයට ඕනෑම වර්ණයක් භාවිතා කළ හැකිය.

(2) පසුතලයට අවශ්‍ය පින්තූරයක් භාවිතා කළ හැකිය.

(3) විවිධ දෘෂ්‍ය රාමු සඳහා එකම වර්ණය භාවිතා කළ හැකිය.

(4) කලින් සකස් කරන ලද දෘෂ්‍ය රාමු රටා (Design Templates) භාවිතා කළ නොහැකිය.

14. ගුණාත්මක ඉ - සමර්පණයක් සළකන විට නිවැරදි ප්‍රකාශයක් වන්නේ,

(1) එක් කදාවක අවම වශයෙන් පේළි 10 ක් වත් තිබිය යුතුය.

(2) කදාවකට පින්තූර , චිත්‍රක යනාදිය ඕනෑම ප්‍රමාණයක් ඇතුලත් කළ හැක.

(3) චලන චිත්‍රක සහ වීඩියෝ යෙදිය හැක්කේ එක් කදාවකට එකක් පමණි.

(4) කදාවක ඇතුලත් කරන අකුරුවල ප්‍රමාණය සාමාන්‍යයෙන් පොයින්ට් 28 කි.

15. මෙහෙයුම් පද්ධති පිළිබද අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ඕනෑම මෙහෙයුම් පද්ධතියක් ඕනෑම වර්ගයක පරිගණකයක පිහිටුවිය හැකිය.

(2) පරිගණකයකින් නිසි ප්‍රයෝජන ගැනීමට නම් මෙහෙයුම් පද්ධතියක් අත්‍යාවශ්‍ය වේ.

(3) පරිගණකය සම්භන්ද මතක කළමණාකරණය කරනුයේ මෙහෙයුම් පද්ධති මගිනි.

(4) එක් පරිගණකයක මෙහෙයුම් පද්ධති එකකට වඩා තිබිය හැකිය.

16. නිදහස් හා විවෘත කේත (FOSS) මෘදුකාංග භාවිතයේ ප්‍රධාන වාසියක් නොවන්නේ,

(1) මුදල් ගෙවීමකින් තොරව නොමිලේ ලබා ගත නොහැකි වීම.

(2) කිසිවෙකුගේ අවසරයකින් තොරව සංස්කරණය කළ හැකි වීම.

(3) වෛරස (Virus) වල බලපෑම අවම වීම.

(4) පොදු මහජන බලපත්‍ර ( GPL) යටතේ බෙදාහැරීම සිදු කිරීම.

17. "අනුපිටපත් නොවීම" සහ "හිස් නොවීම" යන ලක්ෂණ අඩංගු වන්නේ,

(1) සංයුක්ත යතුරකය. (2) ප්‍රාථමික යතුරකය. (3) ආගන්තුක යතුරකය. (4) ඉහත සියල්ලම.

18. පිළිවෙළින් දුරකථන අංකය සහ මූලික වැටුප යන ක්ෂේත්‍ර සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූප වන්නේ ,

(1) පාඨ (Text) , මුදල් (currency ) (2) සංඛ්‍යා (Numeric) , පාඨ (Text)

(3) පාඨ (Text) , සංඛ්‍යා (Numeric) (4) බූලියන් (Boolean) , පාඨ (Text)

19. දත්ත සමුදාය කළමණාකරණ මෘදුකාංගයක් නොවන්නේ ,

(1) MS Access (2) Pascal (3) Libreoffice Base (4) Oracle

20. පැතුරුම්පත් මෘදුකාංගයක යෙදුමක දී භාවිතා වන කෝෂ ලිපින (Cell Address) නිවැරදි ආකාරයෙන් දක්වා ඇත්තේ පහත ඒවායින් කවරක්ද ?

A. - C$5 B. - $C5 C. – C5$

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) A සහ C පමණි. (4) A,B සහ C සියල්ලම.

21. සක්‍රීය කෝෂයක අන්තර්ගතය පෙන්වනුයේ,

(1) Name box තුලය. (2) Formula Bar තුලය. (3) Menu Bar තුලය. (4) Status Bar තුලය.

22. පද්ධතියක් කුඩා ක්ෂේත්‍රයක මුලින් ස්ථාපිත කිරීම යනු ,

(1) නියමුමය පිහිටුවීමයි. (2) අදියරමය පිහිටුවීමයි. (3) සමාන්තර පිහිටුවීමයි. (4) ඍජු පිහිටුවීමයි.

23. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න .

(1) නව තාක්ෂණයේ දියුණුව පද්ධතියට ගැලපීම සිදු කරනුයේ පද්ධතිය පිහිටුවීමේදී ය.

(2) ප්‍රධාන දෘඩාංග පද්ධති සහ ඒවායේ සංඝටක හඳුනා ගනු ලබන්නේ විසඳුම කේතකරනය කිරීමේ දීය.

(3) පෙර අදියරවලට ප්‍රවේශ විය නොහැකිවීම දියඇළ ආකෘතියේ අවාසියකි.

(4) විසඳුම් පරීක්ෂා කිරීමේ ක්‍රමයක් ලෙස ඍජු පරීක්ෂාව දැක්විය හැකිය.

24. වදන් සැකසුම් ලේඛනයක් භාවිතයෙන් ග්ලුකෝස් අනුවක සූත්‍රය $C_6H_{12}O_6$ ලෙස යතුරු ලියනය කරන විට , එහි 6, 12, 6 ඉහත ආකාරයට සකස් කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති කිනම් ගුණාංගය භාවිතා කලයුතුවේද ?

(1) අවුට්ලයින් (Outline) (2) උඩු ලකුණ (Superscript) (3) හැඩසවි කිරීම (Format) (4) යටි ලකුණ (Subscript)

25. 73yashodara@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයේ යම් දෝෂයක් පවතී . එය නිවැරදිව දැක්වෙනුයේ ,

(1) 73 මුලින් යෙදිය නොහැක. (2) gmail.com වෙනුවට yahoo.com විය යුතුය.

(3) 73@yashodaragmail.com විය යුතුය. (4) gmail.com ,gmail ලෙස වෙනස් විය යුතුය.

26. පරිශීලකයන්ට පද්ධතිය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි පරීක්ෂා කිරීම් අදියර වන්නේ ,

(1) ඒකක පරීක්ෂාව (2) පද්ධති පරීක්ෂාව (3) ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (4) සමස්ථ පරීක්ෂාව

27. ඒකාකාර සම්පත් නිශ්චායකයක් , IP ලිපිනයක් බවට පත් කරනු ලබන්නේ ,

(1) Web Server මගිනි. (2) DNS Server මගිනි. (3) Mail Server මගිනි. (4) ඉහත කිසිවක් නොවේ.

28. විද්‍යුත් තැපැල් ලිපිනයක් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්වෙන අනුලක්ෂණය වන්නේ,

(1) . (2) – (3) : (4) @

29. 1919 දුරකථන අංකය මගින් ඔබට සම්බන්ධ විය හැක්කේ ,

(1) විභාග දෙපාර්තමේන්තුව (2) කොළඹ ජාතික රෝහල

(3) රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (4) ශ්‍රී ලංකා පොලිස් හදිසි ඇමතුම් අංශය

30. පහත සඳහන් ගොනු දිගු (File Extensions) අතරින් වදන් සැකසුම් ගොනු දිගුවක් නොවන්නේ ,

(1) .potm , .xlxs , .docx (2) .dot , .wps , .docx

(3) .xlxs , .txt , .wps (4) .pptx , .xlxs , .docx

31. පහත දක්වා ඇති කෙවෙනිවලට අදාල නාම නිවැරදි පිළිවෙලට සඳහන් පිළිතුර වන්නේ ,

A  B  C  D 

B- VGA කෙවෙනිය B- USB කෙවෙනිය B- HDMI කෙවෙනිය B- PS/2 කෙවෙනිය

C- HDMI කෙවෙනිය C- VGA කෙවෙනිය C- USB කෙවෙනිය C- VGA කෙවෙනිය

D- PS/2 කෙවෙනිය D- PS/2 කෙවෙනිය D- VGA කෙවෙනිය D- HDMI කෙවෙනිය

(1) A-USB කෙවෙනිය (2) A- HDMI කෙවෙනිය (3) A- PS/2 කෙවෙනිය (4) A- VGA කෙවෙනිය

32. චන්ද්‍රිකා තාක්ෂණය මගින් දත්ත සම්ප්‍රේෂණය කිරීමේදී සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන එකිනෙක දර්ශනය විය යුතුය. මේ සඳහා යොදා ගනු ලබන දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය වන්නේ,

(1) අධෝරක්ත කිරණ (2) ගුවන් විදුලි තරංග (3) ක්ෂුද්‍ර තරංග (4) සමක්ෂක කේබල

33. දත්ත දත්ත ආචයන ප්‍රමාණය අනුව ආචයන උපාංග ආරෝහණ පිළිවෙළ අනුව සකස් කර ඇති පිළිතුර වන්නේ,

(1) නිහිත මතකය , රෙජිස්තර මතකය , සංඛ්‍යාංක බහුවිධ තැටිය

(2) පඨන මාත්‍ර මතකය , නිහිත මතකය , චුම්භක පටිය

(3) සැනෙලි මතකය , සසම්භාවී පිවිසුම් මතකය , සංඛ්‍යාංක බහුවිධ තැටිය

(4) රෙජිස්තර මතකය , නිහිත මතකය , සංඛ්‍යාංක බහුවිධ තැටිය

34. පහත ප්‍රකාශ අතුරෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ගොනු පිටපත් කිරීමට සහ දෘඩ තැටිවල උපස්ථ ලබා ගැනීමට උපස්ථ මෘදුකාංග භාවිතා කරයි.

(2) පරිගණකයක මෙහෙයුම් පද්ධති එකකට වඩා ස්ථාපිත කිරීම සඳහා පංගු බෙදීම වැදගත් වේ.

(3) තැටි ප්‍රතිභාගීකරණය තුලින් පරිගණකයේ කාර්යක්ෂමතාවය ඉහළ යයි.

(4) MS Dos යනු තත්‍යකාල මෙහෙයුම් පද්ධතියකි.

1.1රූප




35. රූපයේ (1.1) දැක්වෙන ගැලීම් සටහනෙන් නිරූපණය වන පාලන ව්‍යුහ / ව්‍යුහය වන්නේ,
   (1) අනුක්‍රමයක් හා පුනර්කරණයකි.
   (2) වරණයක් හා පුනර්කරණයකි.
   (3) අනුක්‍රමයක් හා වරණයකි.
   (4) අනුක්‍රමයක් පමණි.

36. 1.2 රූපයෙන් දැක්වෙන ගැලීම් සටහනේ වරණය වාර කීයක් ක්‍රියාත්මක වේද ?
   (1) එක් වරක්වත් ක්‍රියාත්මක නොවේ.
   (2) දස වරක් ක්‍රියාත්මක වේ.
   (3) එක් වරක් ක්‍රියාත්මක වේ.
   (4) කිසිවිටෙක අවසන් නොවේ.




37. 1.3 රූපයේ දැක්වෙන ව්‍යාජ කේතය විෂය 05 ක් සඳහා එකතුව හා සාමාන්‍ය ලකුණ ලබාදීම සඳහා ශිෂ්‍යයෙකු විසින් ලියන ලදී. එහි එකතුව නිවැරදිව පෙන්වුව ද සාමාන්‍ය ලකුණ නිවැරදිව නොපෙන්වයි. එය නිවැරදිව පෙන්වීමට කේතය නිවැරදි විය යුත්තේ,
   (1) calculateAvg = total / (x-1) ලෙසයි.
   (2) Avg = 0 පියවර Avg = 1 ලෙසයි.
   (3) Avg = 0 පියවර Average = 0 ලෙසයි.
   (4) x=1 පියවර x=5 ලෙසයි.

1.3රූප

```
Begin
        Total=0
        Avg=0
        X=1
        While x<=5
                Read marks
                Calculate total=total + marks
                x=x+1
        end while
        calculateAvg = total / x
        display total , Avg
end
```

38. පහත පෙන්වා ඇත්තේ ශිෂ්‍යයෙකු විසින් ලියන ලද Pascal කේතයකි . මෙම කේතයට අදාලව 8 ඇතුළත් කළ විට ලැබෙන ප්‍රතිදානය වන්නේ,
   (1) Negative Number
   (2) Positive Number
   (3) Enter Number
   (4) ඉහත කිසිවක් නොවේ.

```
Var number:integer;
begin
writeln('Enter Number : ');
read(number);
if number >0 then
writeln('Negative Number')
else
writeln('Positive Number');
end.
```

39. පහත පෙන්වා ඇත්තේ විෂයයන් 05 ක් සඳහා ලකුණු ඇතුළත් කළ විට එහි එකතුව ලබාගැනීම සඳහා පාසල් ශිෂ්‍යයෙකු වන ලක්මාල් විසින් ලියන ලද Pascal කේතයකි. එහි යම් දෝෂයක් ඇති බව ICT ගුරුතුමා විසින් ලක්මාල්ට පවසයි. එම දෝෂය වනුයේ,
   (1) Begin වලට පසුව (:) තිබිය යුතුයි.
   (2) for වලට පසුව Begin ද writeln (total); වලට ඉහලින් end; තිබිය යුතුයි.
   (3) total:=total+marks යන්න marks:= marks+ total ලෙස වෙනස් විය යුතුයි.
   (4) var count, marks, total :integer; යන්නට පසුව count:=0; marks:=0; total:=0 යන්න පේළි 03 කින් දැක්විය යුතුයි.

```
Var count,marks,total:integer;
begin
for count:= 1 to 5 do

writeln('Enter Your Marks : ');
read(marks);
total:= total+ marks;

writeln(total);
end.
```

40. ඉහත නිවැරදි කළ Pascal කේතයට 10,15,20,25,30.5 ලෙස අගයයන් ලබාදුන් විට ප්‍රතිදානය වන්නේ,
   (1) 100.5    (2) Error    (3) කිසිවක් නැත    (4) 100

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

**දෙවන වාර පරීක්ෂණය - 2017** **11ශ්‍රේණිය**

Second Term Test - 2017 Grade 11

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

Information Communication Technology – II

**පැය දෙකයි**

Two hours

- පළමු වන ප්‍රශ්නය සමඟ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු වන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙකුත් ප්‍රශ්න වලට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

1.

(1) පහත දී ඇති A තීරුවට අදාල උදාහරණය බැගින් සපයමින් B තීරුව සම්පූර්ණ කරන්න.

| A | B |
|---|---|
| වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක් | |
| IP ලිපිනයක් | |
| සෙවුම් යන්ත්‍රයක් (search engine) | |
| වෙබ් අතිරික්සුවක් (web browser) | |

(2)




ඉහත රූප සටහනෙහි A සහ B ආදාන වන අතර F ප්‍රතිදානය වේ. F හි බූලියානු ප්‍රකාශනය ලියන්න.

(3)

```
p=20
Repeat
 p=p+20
until p>=100
Print p
```

මෙම ව්‍යාජ කේතයේ p සඳහා ලැබෙන ප්‍රතිදානය ෂඩ් දශමක සංඛ්‍යාවක් බවට පරිවර්ථනය කරන්න.

(4) දත්ත සම්ප්‍රේෂණ ආකාර 02 ක් නම් කරන්න

(5) පහත දී ඇති A වගුව සහ B වගුව ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන A සහ B ගේ එකිනෙකට ගැලපෙන අයිතම යාකරන්න.

| A වගුව | B වගුව |
|---|---|
| ලොව ප්‍රථම පරිගණක ජාල පද්ධතිය | පිළිසඳර මංඩප (Chat Group) |
| අන්තර්ජාල සේවාවකි | Arpanet |
| අන්තර්ජාල නීති සහ රෙගුලාසි අඩංගු ගොනු | Face Book |
| සමාජ වෙබ් අඩවියකි | නියමාවලි (Protocol) |

(6) නිර්මාණය කරන ලද වෙබ් අඩවියක් අන්තර්ජාලයට සම්බන්ධ කිරීමට ඉවහල් වන ප්‍රධාන අවශ්‍යතා 2ක් නම් කරන්න.

(7) පහත දක්වා ඇති මෘදුකාංග මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක් (Operating Systems ) ද යෙදවුම් මෘදුකාංගයක් (Application Software) ද උපයෝගීතා මෘදුකාංගයක් (Utility Software)ද යන්න දක්වන්න

| | මෘදුකාංගය | වර්ගීකරණය |
|---|---|---|
| 1 | ඔපෙරා (Opera) | |
| 2 | තැටි හැඩසව් ගැන්වීම (Disk Formating) | |
| 3 | විද්‍යුත් පැතුරුම්පත් | |
| 4 | Linux | |

(8) සිසුවකුගේ විෂයයන් 09 ක ලකුණු ඇතුළත් කර සාමාන්‍යය ගණනය කිරීමට ගැලීම් සටහනක් අඳින්න

(9 පහත පෙන්වා ඇති රූප සංස්කරණයට ( image editing ) අදාළ ① සිට ④ දක්වා මෙවලම් හඳුනා ගෙන ඒවායින් සිදුකෙරෙන කාර්යයන් ලියා දක්වන්න.




(10) I. පරිගණක ජාල ඔස්සේ තොරතුරු හුවමාරුවේදී හානිකර තොරතුරු ලැබීම වැලැක්වීමට ….(a)……. (Digital හැදුනුම්පත , Firewall, Hacking ) යොදාගැනේ

II. ඊ මේල් වලදී යවනු ලබන පණිවුඩ වෙනත් අයට තේරුම් ගැනීමට අපහසු අන්දමින් සකස් කිරීමට ……(b)…….. (Digital හැදුනුම්පත , Firewall, ගුප්ත කේත ) භාවිතාවේ

2.

පරිශීලකයා හා පරිගණකය අතර සම්බන්ධතාවය පහත රූප සටහනකින් දැක්වේ. මෙම රූප සටහන භාවිත කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1) උපයෝගීතා මෘදුකාංග යනු කුමක්දැයි හඳුන්වා උදාහරන 02 ක් සපයන්න

(2) මෙහෙයුම් පද්ධතියක ඇති අතුරු මුහුණත් (Interface) ආකාර දෙකක් සඳහන් කරන්න

(3). මෙහෙයුම් පද්ධතියක් ක්‍රියාවලි කලමනාකරනයේදී සිදුනරනු ලබන කාර්යන් 02 සඳහන් කරන්න

(4). "මෙහෙයුම් පද්ධතියක් දෘඩාංග කලමනාකරනය කරයි " දෘඩාංග කලමනාකරනයට අයත් කාර්යන් 04 ක් සඳහන් කරන්න

**3.** සදලි හා ඇගේ මව හා සුපිරි වෙළඳ සැලකට ගොස් ලබා ගන්නා ලද භාණ්ඩ පිළිබඳ විස්තරයක් පහතදක්වා**ඇත.**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | My Shopping List | | | |
| 2 | | | | |
| 3 | Item | Price per unit | Quantity needed | Total price |
| 4 | Medium Cheese Pizza | Rs. 675.00 | 2 | Rs. 1,350.00 |
| 5 | Tooth Brush | Rs. 45.00 | 4 | Rs. 180.00 |
| 6 | Anchor | Rs. 325.00 | 4 | Rs. 1,300.00 |
| 7 | Happy Cow cheese | Rs. 345.00 | 1 | Rs. 345.00 |
| 8 | Kandows chocolate slab | Rs. 258.50 | 1 | Rs. 258.50 |
| 9 | Large Ice Cream | Rs. 450.00 | 2 | Rs. 900.00 |
| 10 | | | | |
| 11 | Total cost for shopping | | | Rs. 4,333.50 |
| 12 | 10% off | | | Rs. 433.35 |
| 13 | Final cost after discount | | | **Rs. 3,900.15** |
| 14 | | | | |
| 15 | Average price of item | | | **Rs. 349.75** |
| 16 | Maximum Price | | | **Rs. 675.00** |
| 17 | | | | |

පහත කෝෂ වලට අදාළ අගයයන් ලබා ගැනීමට සුදුසු සමීකරණ ලියන්න.

(1) D4 (2) D11

(3) D12 (4) D13

(5) D15

04. විශ්ව විද්‍යාලයක උගන්වන විශයන් හා එම විශයන් උගන්වන දේශකවරු සම්බන්දව ඇති තොරතුරු පද්ධතියක කොටසක් පහත වගු වල දැක්වේ.

Lecture

| Lecture_ID | Name |
|---|---|
| 675 | Mr. D.Edvin |
| 723 | Mrs. E.Alvis |
| | |
| | |

Subject

| Subject_Code | Subject_Name |
|---|---|
| ELT2342 | Electronics |
| IMG5236 | Management |
| MAT2424 | Mathematics |
| | |

Lecture_Subject

| Subject_Code | Teacher_ID |
|---|---|
| ELT2342 | 675 |
| IMG5236 | 723 |
| MAT2424 | 675 |
| MAT2424 | 723 |

I. මෙහි ඉහත වගු දෙකක ඇති ප්‍රාථමික යතුරු සඳහා යොදා ඇති අගයන් දෙකක් ලියා දක්වන්න.

II. දත්ත ගබඩා කිරීම සඳහා වගු තුනක් භාවිත කරනු වෙනුවට තනි වගුවක් භාවිත කළේ නම් ඇති වන අවාසි කෙටියෙන් පැහැදිලි කරන්න.

III. ආගන්තුක යතුර යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න වගු ආශ්‍රිතව පැහැදිලි කරන්න.

05. ABC නිවාස ඉදි කිරීමේ ආයතනය තම සේවාදායකයන්ට නිවාස සැළසුම් නිර්මාණය, ඇස්තමේන්තු සැකසීම, නිවාස ණය ලබා ගැනීම සඳහා උදව් කිරීම ඇතුලුව නිවාස ඉදි කිරීමේ කාර්යයේ වසර 10ක් නියුතුව සිටින්නේය. එම ආයතනයේ ඇතැම් කටයුතු පරිගණක භාවිතයෙන් සිදු කළ ද පරිගණක පද්ධතියක් නැත

(1) ඉහත අවස්ථාවට අදාළව භාවිතයට ගන්නා දත්ත හා තොරතුරු 2ක බැගින් ලියන්න.

(2) පරිගණකගත තොරතුරු පද්ධතියක් භාවිතා කිරීම මගින් ABC ආයතනයට ඉදිරි වසර තුළ දි ලබාගත හැකි වාසි 2ක් විස්තර කරන්න

(3) ඉහත කටයුත්ත ඉටුකරගැනීම සඳහා භාවිතයට ගතහැකි මෘදුකාංග 2ක් හේතු සහිතව ලියා දක්වන්න.

(4) පද්ධති සැකසුම් ජීවන චක්‍රයේ ඔබ කැමති අවධි 2ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

06.

(1) http://www.edupub.gov.lkහි ඉහල වසම් නාමය සඳහන් කරන්න
(2) පහත වගුව නිවරදිව නැවත සසන්න.

| | |
|---|---|
| P-විද්‍යුත් ලේඛනවල විශාල එකතුවක් | **http** |
| Q- අන්තර්ජාලය හරහා විශාල ගොනු එක් පරිගණකයක සිට වෙනත් පරිගණකයකට මාරු කිරීම | DNS |
| R- ඒකාකාරී සම්පත් නිශ්චායකයක්(URL) IP ලිපිනයකට පරිවර්තනය කිරීම | FTP |
| S-වෙබ් පිටුවලට ප්‍රවේශ වීම සඳහා වන නියමාවලියක්(protocol) | WWW |

ඔබේ මිතුරකු ඔහුගේ නිවසේ භාවිතය සඳහා උකුළු පරිගණකයක්(laptop) මිලදී ගෙන ඇත. කෙවෙනි(port) හතරකින් යුත් රැහැන් රහිත මාර්ගකාරකයක්(wireless router) භාවිත කරමින් අන්තර්ජාල සේවා සැපයුම්කරුවකුගෙන්(ISP) අන්තර්ජාල සම්බන්ධතාව ලබා ගැනීමට ඔහු අදහස් කරයි.

(3) ඔහුගේ උකුළු පරිගණකය මාර්ගකාරකය හා සම්බන්ධ කිරීමට සුදුසු මාධ්‍ය ප්‍රරූප(media types) දෙකක් නම් කරන්න.
(4) ඔහුගේ නිවසට තවත් උකුළු පරිගණකයක් මිලදී ගන්නේ නම් මෙම මාර්ගකයම යොදා ගෙන එම උකුළු පරිගණකයත් අන්තර්ජාලයට සම්බන්ධ කරවිය හැකිද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(5) මෙම සංසිද්ධියේදී භාවිත වන ස්ථානීය පෙදෙස් ජාලයක් හා පුලුල් පෙදෙස් ජාලයක් හඳුනාගෙන ලියා දක්වන්න.

7.

(1) පහත දැක්වෙන ප්‍රතිදානය ලබා ගැනීමට අවශ්‍ය ව්‍යාජ කේතය ගොඩනගන්න.

“වැසි දිනයක් නම් තම මිතුරාට කුඩයක් රැගෙන යන ලෙසත් නැතිනම් අව් රශ්මිය සහිත දිනයක් බවත් පවසන්න”

(2) පාසලක් තුළ අ.පො.ස. උ/පෙ. සඳහා සිසුන් 100 දෙනෙකුගේ ඉල්ලුම් පත්‍ර විදුහල්පතිතුමා විසින් පරීක්ෂා කරන ලදි. එහිදී එක් එක් ශිෂ්‍යයාගේ ඉල්ලුම් පත්‍ර සුදුසුකම් අනුව එකිනෙක පරීක්ෂා කරන ලදි. ඒ අනුව ශිෂ්‍යයා අ.පො.ස. සා/පෙ. විභාගය සමත් නම්, අ.පො.ස. උ/පෙ. හැදෑරීම සඳහා අවසර ලබා දෙන අතර, නැතිනම් නැවතත් අ.පො.ස. සා/පෙ. විභාගයට පෙනී සිටීමට අවවාද කරන ලදි.




(a) ඉහත ගැලීම් සටහනේ A – F දක්වා හිස්තැන් වලට සුදුසු පද ලියා දක්වන්න.
(b) ඉහත ගැලීම් සටහනට අදාල ව්‍යාජ කේතය ලියා දක්වන්න.